# කොස් කොටන කඩුවක්?



කොස් කැපීම හැමෝටම බැරිය. ඒ කැපිල්ලට කැත්තට වැඩි ආයුදයක් ගන්නේද නැත . කඩුව ගන්නේ මිනිසුන් කපා මරන්නටය. යුද්දෙටය. යුද්දෙට නොගන්න කඩුව ගැන ඔය කතාව පටන් ගත්තේ කඩුව නිරපරාදේ තබා ගැනීම නිසයි. ප්‍රදර්ශන භාණ්ඩයක් කරගත් නිසාය.

ප්‍රදර්ශන භාණ්ඩය කියන යෙදුම මගේ කතාවට ගැළපෙනවාය. මා කියන්නේත් ඒ වාගේ කඩුවක් අපට දෙන්නට යයි මහ සඟනමක කියා වදාල කතාව ගැනය. නායක ස්වාමින්වහන්සේ නමක්. උන් වහන්සේ කියා තිබුණේ කාලෝචිත කීමකි. කාලයට ඔබින - දේශයට කියාපු කියමනකි.

භික්ෂුන්ටත් අධිකරණ බලතල දිය යුතුය. සෑම භික්ෂුවකටම නොවේ. නායක භික්ෂුන් වහන්සේට. මට මතක් වන්නේ සංඝනායක හාමුදුරුවන් පස් නමය. මෑතක සියම් නිකායේ සංඝනායක පදවිය ලබා ගත් භික්ෂුන් වහන්සේ ගැන මගේ සිංගරු සිරිතේ (2013) පරිච්ඡේදයක්ම වෙන් කොට ඇත . එහෙත් මා දැක නැති හිමි නමකි. අනෙක් සංඝනායක හිමිවරුන් සිවුදෙනාගෙන් තුන් දෙනකු මම යම්තමට හෝ හඳුනමි. එක් මහනායක හිමිනමක් මා බලන්නටද පැමිණියහ.

ඒ හැම දෙනාම (නිකාය ත්‍රයකය අයත්වුවද) හඳුන්වනු ලබන්නේ ඕස්ට්‍රේලියාවේ අධිකරණ සංඝනායක යනුවෙන් යයි සිතමි. ඒ නාමය ශ්‍රී ලංකාවේද බහුල භාවිතයට පත්ව ඇති එකකි. එපමණක් නොවේ. අප්‍රිකාව සහ දකුණු ඇමරිකාව හැරුණුවිට අනෙක් මහාද්වීප හැම එකකම යටත් පිරිසෙයින් එක් අධිකරණ සංඝනායක ස්වාමින්වහන්සේ කෙනෙක්වත් සිටිති.

ඒ තරමට වැඟි වැහැපුගාණාට රට පුරා - ලොව පුරා - අධිකරණ සංඝනායකයන් සිටිද්දී අලුතින් මෙහෙම ඉල්ලීමක් කරන්නටද හේතුවක් තිබිය යුතුය.

හේතුව පැහැදිලිය. දැන් තියෙන එක අර කියාපු කඩුවට සමානය. නමට පමණය. ප්‍රදර්ශන භාණ්ඩයක් විතරය. මුවාතක් නැත .

ශ්‍රී ලංකාවේ මහනායක ස්වාමින් වහන්සේලාට (ගණන මට හරියට මතක නැත. හතක් හෝ අටක් විය හැකිය) දැන් තියෙන ගැටලුව කඩුව මුවාත් කරනවාද නැතහොත් නව පන්නයේ කග පතක් නිර්මාණය කරනවාද කියන එකය.

එයත් කදිම ක්‍රීඩාවක් වනු සිකුරුය. නවතම භික්ෂු ක්‍රියාකාරීත්වය නොහොත් විනෝදාංශය එය වනු ඇත . දැනටමත් මේ රටින් ඕස්ට්‍රේලියාවට අපි එක් චිත්‍රපට අධ්‍යක්ෂකවරයකු ඉදිරිපත් කරන්නෙමු. භික්ෂුන් වහන්සේ නමක්. නායක හාමුදුරු නමක්.

ශ්‍රී ලංකාව ඒ අතින් අප පරදවා හමාරය. මෑතක වේදිකාගත කරන ලද (එය අවතක්සේරු නොකළ යුතුය) ඒකාංක නාට්‍යය ගැන පුවත්පත් ඔස්සේ සෑහෙන විචාරයක් ලියැවී ඇත. භික්ෂුවක් විසින්ම පිටපත ලියනු ලැබ - පුහුණු කරනු ලැබ - අධ්‍යක්ෂණය කරනු ලැබ තමා විසින්ම රඟ පාන ලද සුපරසිදු නාට්‍යය. දැන් ඒ හාමුදුරුවන්ට පොලීසියට කටඋත්තර දෙන්නට සිද්ද වෙලාය.

භික්ෂු නාට්‍ය වේදිකාව මත (මේ යෙදුම අකැමැත්තෙන් වුවත් යෙදීමට සිදුවෙනවාය) රඟ දක්වන නාටක ගණන සහ ස්වරූපය දිනෙන් දින වෙනස්වන ආකාරයක් දැකිය හැකිය. මුලටම කුඩුකාරයෝ සහ බුකිකාරයෝ හදපු කේක් ගෙඩිය කපා උපන්දින සමරණ භික්ෂු ජවනිකාවය. ඊ ළඟට මුස්ලිම් වානිජ ආයතනවලට කඩා වදින චීවරධාරී රංගනයයි. තවත් වරකට ක්‍රිස්තියානි පල්ලිවලට පොලු අරගෙන පුද සත්කාර සඳහා වැඩම කරන සුපේශල මහා සංඝයාය. ඔය අතර වාරයේ මුස්ලිම් දේවස්ථාන වල නව මාදිලියේ රාජකාරියක් ඉටු කරනු වස් පිවිසෙන ශික්ෂාකාමී මහා සංඝරත්නයයි.




ඔයා කියාපු නළුවන් චිත්‍රපට අධ්‍යක්ෂවරුන් ඇතුළු අනෙක් විකාරකාරයන් තුන්දෙනාම අයත්වන්නේ අප උදේ හවා පන්සිල් ගැනීමට නැතහොත් කීමට පෙර කියන තුන් සරණයෙන් එක සරණයකටය. සැරියුත් මුගලන් පරපුරෙන් පැවත එන සිරිලක් දිව දෙදහස් පන්සිය වසරක් බුදු දහම රැකගෙන ආ අපේම මහා සංඝරත්නයේ ගරුතර සාමාජිකයෝය.

මේ වයිවාරන්න චරිත හැඳින්වීමට මම පොදු වචනයක් යොදා ගනිමි. එයත් අමාරු රාජකාරියකි. හිතලා හිතලා ඒ පොදු යෙදුම හැටියට "හයිරන් කාරයෝ" යන අරුත්බර වචනය තෝරා ගතිමි. එයට අකැමැති අය සිටිය හැකි ය. ඔවුන් වඩා උචිත පදයක් තෝරා ගත්තාවේ.

මට අහන්නට එකම ප්‍රශ්නයක් ඇත . ප්‍රශ්නයේ කොටස් දෙකකි. මෙන්න මගේ ප්‍රශ්නය.

1 ඔය කියන නව පන්නයේ අධිකරණ සංඝනායකයන් පත්කරන බලධාරියා නොහොත් බලධාරීන් කවුද? මහ නා හිමිවරුද?

2 එහෙම බලයක් ඇති කෙනෙක් සිටිත් නම් දැන් ඒ බලධාරීන් මොකද කරන්නේ?

අත පොරවාගෙන බලා ඉන්නවාද?

ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises

**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au